# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරී තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පවතින පුරප්පාඩු සංඛ්‍යාව** :- 02

**02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය** :- 2026.06.11

**03. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුය.**

**04. බඳවා ගැනීමේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-**

| අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම | |
| මව්බස (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂයය ධාරාව (ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් 2ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ (ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂනවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් නොගැනේ.) | I. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෙවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>II. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෙවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම.<br>හෝ<br>III. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>IV. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>V. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) ලබා තිබීම. |

**05. තනතුරට අදාළ වැටුප් පරිමාණය :-**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III ශ්‍රේණියට අදළ වැටුප් කාණ්ඩය MN 3-2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250-10X800-11X1190-10X1320-10X1350 - රු. 100,040/- වේ.

**06.** මෙම තනතුරට බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළ කර ඇත.

**ඩබ්. ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, සබරගමුව පළාත.**
**2026.05.08**

# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය) ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය) ජනපද නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2026.06.11

03. 3:1 පොදු සුදුසුකම් :-

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(v) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය.

(vi) බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

(vii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට මෙම ක්ෂේත්‍රයට අදාළව අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අනිවාර්ය වේ.

(viii) සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

3:2. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

| අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම | තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම | |
| මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂයය ධාරාව (ජීව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් 2 ක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ (ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම(සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් නොගැනේ) | I,කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>II,තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම.<br>හෝ<br>III,මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ |

| | | |
|---|---|---|
| | | IV,රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>V,ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (කෘෂිකර්ම) ලබා තිබීම. |

සටහන :- පවතින පුරප්පාඩු සංඛ්‍යාව 02 කි.

04. **මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය :-**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3 – 2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250- 10×800- 11×1190- 10×1320- 10×1350 - රු. 100,040/- වේ.

05. III ශ්‍රේණියේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරු යටත් විය යුතුවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත තරඟ විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජන අනුපාතය මත දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල පදනම් කර ගනිමින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. තරඟ විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.

<u>බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගයේ විෂයය නිර්දේශය</u>:

I. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි. - ලකුණු 100 යි.

අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි.

II. විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 03 යි. - ලකුණු 100 යි.

- i ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා ජනාවාසකරණය.
- ii ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාර ඉතිහාසය.
- iii ජනපද ව්‍යාපාර හා ජනාවාස පිහිටුවීම.
- iv ජනපද ව්‍යාපාර කළමනාකරණය.
- v රජයේ ඉඩම් බෙදාදීමේ ක්‍රමවේද
- vi ජනපද ව්‍යාපාර පසු කටයුතු.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා වලංගු ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

(I) කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව පහත සඳහන් පරිදි වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය.

a. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
b. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

## 08. අයදුම් කිරීමේ ක්‍රමය

8:1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

8.3 විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතන වලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

8:4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.06.11 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8:5 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව මෙම පුරප්පාඩු හා ඉදිරියේදී ඇති වන පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තිරණය ගැනීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2026.05. 08

**ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත.**